**ශීර්ෂය 217 - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**---------------------------------**

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**-----------------------------------------------------------------------------------------------------------**

-

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය

පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනා ගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ අන්තර්ගත අත්තිකාරම් ලැබීම්, අත්තිකාරම් ගෙවීම්, තැන්පතු ලැබීම්, තැන්පතු ගෙවීම් ශේෂවලට අදාලව භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතවල සඳහන් වටිනාකම් හා මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වටිනාකම් අතර, පහත සඳහන් පරිදි වෙනස්කම් පැවතුණි. මෙම වෙනස්කම් සඳහා හේතු පැහැදිලි නොකෙරුණි. | වෙනස්කම් සඳහා හේතු පැහැදිලි වන ලෙස සැසඳීම් කල යුතු වීම. | ඉදිරි වර්ෂවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී මෙම ශේෂ නිවැරදිව ඇතුළත් කිරීමට උපදෙස් ලබා දුනිමි. |

| විස්තරය | භාණ්ඩාගාර වගුවල සඳහන් වටිනාකම රු. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම රු. |
|---|---|---|
| අත්තිකාරම් ලැබීම් | 12,229,502 | 11,453,220 |
| අත්තිකාරම් ගෙවීම් | 9,749,174 | 9,005,603 |
| තැන්පතු ලැබීම් | 2,471,212 | 1,072,939 |
| තැන්පතු ගෙවීම් | 2,436,741 | 1,038,468 |

| | | |
|---|---|---|
| (ආ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම යටතේ රු.1,559,889 ක වියදමක් දක්වා තිබුණ ද, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ එම අගය රු.1,132,132 ක් වීම හේතුවෙන් රු.427,757 ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනස්කම් සඳහා හේතු පැහැදිලි වන ලෙස සැසඳීම් කල යුතු වීම. | මු.රෙ. 208 යටතේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා වෙන් කළ ප්‍රතිපාදන යටතේ එම කාර්යාලවල මිලදී ගැනීම ඇතුළත් කල නොහැකි වීම හේතුව මත මෙම වෙනස ඇති වී ඇත. |

| | | |
|---|---|---|
| (ඇ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වෙනත් ලැබීම් ලෙස රු.4,605,474 ක් දක්වා තිබුණ අතර, මාසික ගිණුම් සාරාංශ අනුව එය රු.14,453,228 ක් වීම හේතුවෙන් රු.9,847,754 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනස සඳහා හේතු පැහැදිලි නොකෙරුණි. | වෙනස්කම් සඳහා හේතු පැහැදිලි වන සේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වීම. | ඉදිරි වර්ෂවල මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී නිවැරදිව ඇතුළත් කිරීමට උපදෙස් ලබා දුනිමි. |

**1.6.2 <u>ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම</u>**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ස්ථාවර වත්කම් ලේඛනය** | | |
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/ මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර ස්ථාවර වත්කම් ලේඛනය අදාළ වන පරිදි විගණකාධිපතිගේ එකඟත්වය ඇතිව පවත්වා එය යාවත්කාලීන කල යුතුය. | යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත. |
| **(ආ) ඇප ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරින් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. | පවත්වා ගෙන යාමට උපදෙස් දී ඇත. |
| **(ඇ) විදුලි උපකරණ පිළිබඳ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 454(2) හි සඳහන් පරිදි රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතුය. | පිළියෙල කිරීමට උපදෙස් දී ඇත. |

**(ඇ) හානි පිළිබඳ ලේඛනය**

**--------------------------**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. | පවත්වා ගෙන යාමට උපදෙස් දී ඇත. |

**(ඉ) බැරකම් පිළිබඳ ලේඛනය**

**-----------------------------**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය. | පවත්වා ගෙන යාමට උපදෙස් දී ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වැය විෂයයන් 3 ක් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 29 සිට සියයට 79 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතුය. | අරපිරිමැසුම්දායක බව හා අපේක්ෂිත අවශ්‍යතා මතු නොවීම. |
| (ආ) වැය විෂයයන් 2 ක් යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට යවන ලද එකතුව රු.49,789,176 ක ප්‍රතිපාදනවලින් දරන ලද වියදම වැය ලෙජරයේ ඇතුළත් නොකිරීම හේතුවෙන් වැය ලෙජරයේ සංඛ්‍යා, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතවල සඳහන් සංඛ්‍යා සමඟ සැසඳීමට නොහැකි විය. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට යවන ලද ප්‍රතිපාදනවලින් දරන ලද වියදම් වැය ලෙජරයට ඇතුළත් කළ යුතු වීම. | වැය ලෙජරයට ඇතුළත් කිරීමට උපදෙස් දී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 දැක්ම හා මෙහෙවර

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජාතික ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අනාථ, අත්හල හා අසරණ ළමුන්ගේ ද, නීතිමය ගැටළුවලට බඳුන් වූ වෙනත් ළමයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරමින් ඔවුන්ට සමාන අවස්ථාවක් උදා කරදීම දෙපාර්තමේන්තුවේ මෙහෙවර විය. එහෙත් 1956 වර්ෂයේ ආරම්භ වූ දෙපාර්තමේන්තුවට වර්ෂ 62 ක් ගත වී තිබුණත්, ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි විශ්ව ප්‍රඥප්තියට අනුකූලව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම හා ඊට අදාල නීති සම්පාදනය කිරීම 2018 වර්ෂය වන විටත් සිදු කර නොතිබුණි. | මෙහෙවරට අනුකූලව ක්‍රියාකිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කළ යුතුවීම. | විකල්ප රැකවරණ ප්‍රතිපත්තියක් සකස් කිරීමට පියවර ගන්නා ලදී. |

## 3.2 කාර්ය භාරයන් ඉටු නොකිරීම

---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** ළමයින් සඳහා වන සමාජ ආරක්ෂණ වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 51 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර, සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන් ඇතුළත් කරමින් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය පරීක්ෂා කිරීමේ දී පහත කරුණු නිරීක්ෂණය විය.<br><br>සමාජය තුළ ළමා ආරක්ෂාව ශක්තිමත් කිරීමේ අරමුණින් දිස්ත්‍රික්ක 25 තුළ වැඩමුළු 25 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.405,000 ප්‍රතිපාදන සලසා ගෙන තිබුණ ද සමාලෝචිත වර්ෂය තුළ රු.115,000 ක් වැය කර එක් වැඩමුළුවක් පමණක් පවත්වා තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා කළ යුතු වීම. | රටතුළ ඇති වූ අයහපත් පසුබිම හේතුවෙන් එක් වැඩසටහනක් පමණක් පැවැත්වීමට හැකි විය. |
| **(ආ)** ජාතික හා පළාත් මට්ටමෙන් සම්බන්ධීකරණය වර්ධනය කර ගැනීම සඳහා කමිටු 18 ක් පිහිටුවීමට රු.1,100,000 ක ප්‍රතිපාදන සලසා තිබුණ අතර, සමාලෝචිත වර්ෂය තුළ රු.22,000 ක් වැය කර කමිටු 2 ක් පමණක් පිහිටුවා තිබුණි. | | 2018 වසර තුළ දී අපේක්ෂිත පරිදි පළාත් කමිටු රැස්වීම් පැවැත්විය නොහැකි වූ අතර, වෙන් කරන ලද ප්‍රතිපාදන ද අපේක්ෂිත පරිදි වැය කල නොහැකි විය. |
| **(ඇ)** ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන්, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්, විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සංවර්ධන නිලධාරීන්, පොලිස් නිලධාරීන් සඳහා දින 3 ක පුහුණු වැඩසටහන් 11 ක් සිදු කිරීමට රු.1,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, රු.303,000 ක් වැය කර එක් වැඩසටහනක් පමණක් පවත්වා තිබුණි. | | බාහිර ආයතන නිලධාරීන් සම්බන්ධ කර ගැනීමේ අපහසුතා හේතුවෙන් අනෙක් පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ළමා සභාවල ව්‍යුහය හා කාර්යයන් පිළිබඳව අත්පොත් මුද්‍රණය කිරීම, ළමයින් සමඟ කටයුතු කරන සියලුම නිලධාරීන් සඳහා දිස්ත්‍රික්කයකට එක බැගින් හා දින දෙකක ජාතික වැඩසටහනක් පැවැත්වීම, ළමයින් සමඟ කටයුතු කරන ආයතනවල හා පුද්ගලයින්ගේ ධාරිතා සංවර්ධනය කිරීම සඳහා වැඩසටහන් 6 ක් පැවැත්වීම යන කාර්යයන් වෙනුවෙන් රු.මිලියන 3.6 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද, සමාලෝචිත වර්ෂය තුළ එම කාර්යයන් ඉටු කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා කළ යුතුයි. | නිලධාරී ස්ථාන මාරු වීම් හා එකල පැවැති අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් වැඩසටහන් ප්‍රමාණය සම්පූර්ණ කිරීමට නොහැකි විය. |
| (ඉ) | සමාජය තුළ දරුවන්ගේ ආරක්ෂාව ශක්තිමත් කිරීමේ අරමුණින් රු.1,780,000 ක් ප්‍රතිපාදන සහිතව සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ වැඩසටහන් 3ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා කළ යුතුයි. | |
| (ඊ) | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වූ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු කාර්යයන් සම්බන්ධීකරණය, සහාය වීම, ප්‍රගතිය විමසීම හා ඒ යටතේ ක්‍රියාත්මක වන විවිධ ආයතන සඳහා මඟ පෙන්වීම යනාදිය සමාලෝචිත වර්ෂය තුළ දී ඉටු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් බැවින් එම කාර්යයන් ඉටු කළ යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. |